“අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පාවහන් පැළඳීමේ දී ද හිසකෙස් සැකසීමේ දී ද පිරිසිදු කිරීමේ දී ද එතුමාණන්ගේ සෙසු සියලු කටයුතු වල දී ද එතුමාණෝ දකුණත ප්රිය කරන්නෙකු වූහ.”

දේව විශ්වාසීන්ගේ මෑණිය වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා
කරන ලදී. “අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පාවහන් පැළඳීමේ දී ද හිසකෙස් සැකසීමේ දී ද පිරිසිදු කිරීමේ දී ද එතුමාණන්ගේ සෙසු සියලු කටයුතු වල දී ද එතුමාණෝ දකුණත ප්රිය කරන්නෙකු වූහ.”
[صحيح] [متفق عليه]

ගරු කටයුතු හා සම්බන්ධ සියලු කරුණුවලදී තම දකුණතින් ආරම්භ කිරීමට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්රමුඛත්වය දුන් අතර එය ප්රිය කරන්නෙකු වූහ. මිනිසා පාවහන් පැළඳීමේ දී දකුණු පාදයෙන් ආරම්භ කළ යුතුය. තම හිසකෙස් හා තම රැවුල පීරීමේ දී ඒවා සැකසීමේ දී හා ඒවාට තෙල් ගැල්වීමේ දී දකුණතින් ආරම්භ කළ යුතු ය. එමෙන්ම වුළූ කිරීමෙහි ද තම දෙඅත් හා දෙපා අතරින් වමතට පෙර දකුණතට ප්රමුඛත්වය දිය යුතුය.

https://sunnah.global/hadeeth/si/show/3018